# විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
## வெளிநாட்டுவளங்கள்திணைக்களம்
## Department of External Resources

*PRUIO

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3වැනි මහල),තැ.පෙ. 277,කොළඹ00100, ශ්‍රී ලංකාව

நிதிஅமைச்சு
செயலகம்(3ஆம்மாடி),த. பெ. இல. 277,கொழும்பு00100,இலங்கை
Ministry of Finance
The Secretariat(3rd Floor), P.O. Box 277, Colombo 00100, Sri Lanka

**Web Site**:www.erd.gov.lk **e-mail:**info@erd.gov.lk


මගේ අංකය
எனதுஇல
My No

ඔබේ අංකය
உமதுஇல
Your No

දිනය
திகதி
Date
2021 [illegible] 11

## <u>මාධ්‍ය නිවේදනය.</u>

**<u>හදිසි අවස්ථා ප්‍රතිචාර සඳහා සෞඛ්‍ය පද්ධති සූදානම් කිරිමේ දෙවන අතිරේක මූල්‍යයන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඇ.ඩො.මි. 80.51 ක මූල්‍ය පහසුකමක් ලෝක බැංකුවෙන් ලැබීමට නියමිතය.</u>**

COVID – 19 වසංගතය පෙර නොවූ ආකාරයට මානව වර්ගයාට තර්ජනයක් වී ඇත. 2020 වර්ෂයේ COVID – 19 වසංගතය ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා බැදුණු සෑම කර්මාන්තයකටම සෘජුව හා ඉතා තදින් බලපා ඇත. කෙසේ වුවත්, ආර්ථික පුනර්ජනනීය කටයුතු ආරම්භ කිරීමට ප්‍රයත්න දරමින් COVID සමඟ නව සාමාන්‍යකරණයට අනුගත වීමට එන්නත්කරණය තීරණාත්මක කාර්යභාර්යයක් කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ COVID – 19 රෝගීන් සංඛ්‍යාව වේගවත්ව වැඩිවීමත් සමඟ රටට දරාගත හැකිසේම COVID – 19 එන්නත් සැමට ලබාදිය හැකි සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීමටත්, එන්නත් ක්‍රමවේදය ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ කාර්යක්ෂම ලෙස එන්නත්කරණය සිදුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය හදිසි අවස්ථා ප්‍රතිචාර සෞඛ්‍ය පද්ධති තවදුරටත් සූදානම් කිරීම ශක්තිමත් කිරීමටත්, රජය ප්‍රමුඛත්වය ලබාදී තිබේ. මෙම යෝජිත ව්‍යාපෘතියේ ඒකායන අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ COVID – 19 එන්නත්කරණ වැඩසටහන ආරම්භයේ සිට ඒම එන්නත් බෙදාහැරීමේ කටයුතු හා සම්බන්ධ වියදම් මෙන්ම ඒම එන්නත්කරණ ක්‍රියාවලියට අදාළ අනෙකුත් වියදම් ආවරණය කරන අතරම, ලෝක බැංකුවේ එන්නත් අනුමත කිරීමේ නිර්නායක වලට අනුව COVID – 19 ඒන්නත් ප්‍රසම්පාදනයට උපකාරී කිරීමයි.

ඒ අනුව මෙම COVID – 19 ඒන්නත්කරණ ව්‍යාපෘතිය මඟින් මෙම වසංගත උවදුර ආරම්භක අවධියේ සිටම පාලනය කිරීමත්, ක්‍රමයෙන් (Herd Immunity) සමූහ ප්‍රතිශක්තිකරණයට ළඟාවීමටත් අපේක්ෂිතයි. මූලික සෞඛ්‍ය ප්‍රතිලාභ වලට අමතරව මෙම ඒන්නත්කරණය ආර්ථිකය යථාතත්වයට නැංවීමේ වැඩපිළිවෙල වේගවත් කිරීම යටතේ විශේෂයෙන් සංචාරක


අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
94-11-2484693

කාර්යාලය
அலுவலகம்
Office
94-11-2484500
94-11-2484600

ෆැක්ස් අංකය
தொலைநகல்
Fax
94-11-2447633
94-11-2387153
94-11-2434876

කර්මාන්තය හා අපනයන අංශයේ විශ්වාසය ගොඩනැංවීම තුළින් ආයෝජන ප්‍රතිලාභ වැඩිකිරීමට අපේක්ෂිතය.

ඒ අනුව ව්‍යාපෘතියට අදාළ මූල්‍ය හා ණය ගිවිසුම් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා සහ ලෝක බැංකුව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ලෝක බැංකු අධ්‍යක්ෂ Faris H. Haded-Zervos මහතා පසුගිය දා අත්සන් කරන ලදි.